# මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

## (කර්මාන්ත හා ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යාංශය)

# පුරප්පාඩු

පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් හා පළපුරුද්ද සහිත අයදුම්කරුවන්ගෙන් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01 අධ්‍යක්ෂ (පර්යේෂණ) – (HM 1-1) - තනතුරු 01

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන්**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන රත්නවිද්‍යාව/ භූ විද්‍යාව/ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව හෝ ඊට අදාළ වෙනත් විෂයය ක්ෂේත්‍රයක මූලික (Bachelor's) උපාධිය. (විශේෂ උපාධි සඳහා ප්‍රමුඛතාවය දෙනු ලැබේ.)

**සමග**

(ආ) රත්නවිද්‍යාව /භූ විද්‍යාව/ භූ විද්‍යාව /භෞතික විද්‍යාව /රසායන විද්‍යාව හෝ අදාළ ක්ෂේත්‍රයක පශ්චාත් උපාධියක් ලබා තිබීම.

**සහ**

(ඇ) රජයේ, රාජ්‍ය සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර 15ක අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ පිළිබඳ පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සම්පූර්ණ කිරීම.

(ආ) මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ පර්යේෂණ (AR 2) සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 5ක, අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** HM 1-1 – 2025 - රු. (140,640 – 15 X 4,100 – 202,140) + රජයේ අනුමත දීමනා +E.P.F 15%, E.T.F 3%

**වයස:** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 02. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (නවෝත්පාදන) – (AR -2) - තනතුරු 01

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් මැණික් විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / භූ විද්‍යාව / ස්වර්ණාභරණ විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) සහ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ පිළිබඳ පළපුරුද්ද.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් රත්නවිද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / භූ විද්‍යාව විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (Ph.D.) සමග පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ පිළිබඳ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් මැණික් විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / භූ විද්‍යාව විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් (අදාළ ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක් ඇති අය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ) සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters) සහ අධ්‍යයන / පර්යේෂණ කාණ්ඩයේ (AR 1) තනතුරක, අදාළ විෂය ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** AR -2 – 2025 - රු. (133,220 - 10 X 3,600 – 169,220) + රජයේ අනුමත දීමනා +E.P.F 15%, E.T.F 3%

**වයස:** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 03. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (වර්ණය වැඩිදියුණු කිරීම) – (AR -2) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් රත්නවිද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / භූ විද්‍යාව / ස්වර්ණාභරණ විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක් (Masters) සහ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර අටක (08) අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ පිළිබඳ පළපුරුද්ද.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් මැණික් විද්‍යාව / රසායන විද්‍යාව / භෞතික විද්‍යාව / භූ විද්‍යාව විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී විශේෂ උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයක ආචාර්ය උපාධියක් (Ph.D.) සමග පළමු උපාධිය ලබා ගැනීමෙන් පසුව, රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක අවම වශයෙන් වසර පහක (05) අදාළ ක්ෂේත්‍රයෙහි පර්යේෂණ පිළිබඳ පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින රත්නවිද්‍යාව/ රසායන විද්‍යාව/ භෞතික විද්‍යාව/ භූ විද්‍යාව විෂය සංයෝජනයක් සහිත විද්‍යාවේදී උපාධියක් හෝ ඉංජිනේරු උපාධියක් (අදාළ ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක් ඇති අය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි සුදුසුකමක් (Masters) සහ අධ්‍යාපන/ පර්යේෂණ කාණ්ඩයේ (AR 1) තනතුරක අදාළ විෂය ක්ෂේත්‍රය තුළ අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** AR -2 – 2025 - රු. (133,220 - 10 X 3,600 – 169,220) + රජයේ අනුමත දීමනා +E.P.F 15%, E.T.F 3%

**වයස:** අවුරුදු 35 ට නොඅඩු හා අවුරුදු 55 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### 04. සහකාර අධ්‍යක්ෂ (රත්නවිද්‍යා) (MM 1-1) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන රත්නවිද්‍යාව/ භූ විද්‍යාව/ ඛණිජ විද්‍යාව/ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව හෝ ඊට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයක විද්‍යා උපාධියක් ලබා තිබීම. (අදාළ විෂය ක්ෂේත්‍රයේ විශේෂ උපාධියක ඇති අය සඳහා සම්මුඛ පරීක්ෂණයේදී ප්‍රමුඛතාවය දෙනු ලැබේ.) සහ පළමු උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පළපුරුද්දක් ලබා තිබීම.)

(ආ) තෘතීය වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද මැණික්/ ස්වර්ණාභරණ හෝ අදාළ ක්ෂේත්‍රයේ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ)7 වැනි මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම සහ රාජ්‍ය සේවයක, සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක ආයතනයක හෝ පිළිගත් පෞද්ගලික ආයතනයක මැණික් විද්‍යා ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසරක (01) පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ කණිෂ්ඨ කළමණාකරණ සේවා කාණ්ඩයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**වැටුප් පරිමාණය:** MM 1-1 -2025 රු. (91,690 - 10 X 2,480 – 15 X 3,450 - 168,240) + රජයේ අනුමත දීමනා + E.P.F 15%, E.T.F 3%

**වයස :** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව බල නොපායි.

### 05. පර්යේෂණ නිලධාරී (AR – 1) - තනතුරු 05

**සුදුසුකම්:**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ), (ආ) හෝ (ඇ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන රත්නවිද්‍යාව/ භූ විද්‍යාව/ ඛණිජ විද්‍යාව/ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව/ ස්වර්ණාභරණ විද්‍යාව/ කැනීම් ඉංජිනේරු / ද්‍රව්‍ය විද්‍යා ඉංජිනේරු/ විෂයන් සහිත හෝ ඊට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයක විද්‍යා විශේෂ උපාධියක් ලබා තිබීම.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (UGC) විසින් පිළිගනු ලබන රත්නවිද්‍යාව/ භූ විද්‍යාව/ ඛණිජ විද්‍යාව/ භෞතික විද්‍යාව/ රසායන විද්‍යාව/ ස්වර්ණාභරණ විද්‍යාව විෂයන් සහිත හෝ ඊට අදාළ වෙනත් විෂය ක්ෂේත්‍රයක විද්‍යා සාමාන්‍ය උපාධියක් ලබා තිබීම සමග අදාළ විෂය ක්ෂේත්‍රයකින් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම.

(ඇ) තනතුරට අදාළ ක්ෂේත්‍රය තුළ පිළිගත් වෘත්තිමය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership) ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) කණිෂ්ඨ කළමනාකරු (JM 1-1) සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 8ක, අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** AR 1 – 2025 -රු. (91,650 – 10 X 2,480 – 15 X 3,450 – 168,200) + රජයේ අනුමත දීමනා +E.P.F 15%, E.T.F 3%

### 06. පර්යේෂණ නිලධාරී (භූගෝලීය තොරතුරු පද්ධති) (AR-1) - තනතුරු 01

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන් - පහත (අ), (ආ) හෝ (ඇ)**

(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් විද්‍යා/භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සමග කලා/ භූගෝල විද්‍යාව විෂය සංයෝජනයන් සහිත හෝ අදාළ ක්ෂේත්‍රයක විශේෂ උපාධියක්.

(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව (U.G.C.) විසින් පිළිගත් විද්‍යා/භූගෝලීය තොරතුරු පද්ධති (GIS) සමග කලා/භූගෝල විද්‍යාව විෂය සංයෝජනයන් සහිත හෝ අදාළ ක්ෂේත්‍රයක සාමාන්‍ය උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් (Post Graduate Diploma) ලබා තිබීම.

(ඇ) තනතුරට අදාළ ක්ෂේත්‍රය තුළ පිළිගත් වෘත්තිමය වරලත් ආයතනයක ආශ්‍රිත සාමාජිකත්වය (Associate Membership)ලබාතිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන් - පහත (අ) හෝ (ආ)**

(අ) ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.

(ආ) කණිෂ්ඨ කළමනාකරු (JM 1-1)සේවා ශ්‍රේණියෙහි තනතුරක අවම වශයෙන් වසර 8ක, අදාළ විෂය ක්ෂේත්‍රයෙහි සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** AR 1 – 2025 - රු. (91,650 – 10 X 2,480 – 15 X 3,450 – 168,200) +රජයේ අනුමත දීමනා +E.P.F 15%,E.T.F 3%

**වයස:** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

### පර්යේෂණ සහකාර (MA 2-2) - තනතුරු 03

**සුදුසුකම් :**

**බාහිර අයදුම්කරුවන්**

(අ) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව (TVEC) මගින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ රජය මගින් අනුමත කරන ලද වෙනත් පිළිගත් ආයතනයකින් ලබාගත්, රත්නවිද්‍යාව / භූ විද්‍යාව / භෞතික විද්‍යාව / රසායන විද්‍යාව / ඉංජිනේරු විද්‍යාව හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) මට්ටම 5 ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(ආ) ඉහත බාහිර අයදුම්කරුවන් සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා තිබීම.

වැටුප් පරිමාණය : MA 2-2 – 2025 - රු. (50,540 –10 X 540–7 X 630 –4 X 1080–20 X1280–90,270) +රජයේ අනුමත දීමනා +E.P.F 15%, E.T.F 3%

**වයස:** අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**සෑම අයදුම්කරුවෙකුම :**

i. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.

ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.

iii. විශිෂ්ට චරිතයෙන් යුක්ත විය යුතුය.

**අයදුම් කළ යුතු ආකාරය:**

(1) මේ සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන් **අධ්‍යාපන සහතික, වෘත්තීමය සුදුසුකම් සහ අනෙකුත් සහතික වල සහතික කරන ලද පිටපත් සමග ඔබගේ ඥාතීන් නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ (02) විස්තර** සඳහන් සම්පූර්ණ කරන ලද ජීව දත්ත සටහන පහත සඳහන් පරිදි ලැබීමට සැලැස්විය යුතුය.

(2) ඉහත (1) හි සඳහන් අවශ්‍ය ලේඛන අමුණා නොමැති අයදුම්පත්, අසම්පූර්ණ අයදුම්පත් සහ ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(3) අයදුම් කරනු ලබන තනතුර ලියුම් කවරයේ ඉහළ වම්පස කෙළවරේ සඳහන් කොට **2026.10.28** දින හෝ ඊට ප්‍රථම පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතුය.

(4) දැනට රාජ්‍ය, අර්ධ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන වල සේවයේ නියුතු අයදුම්කරුවන් තම අයදුම්පත අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුවේ.

(5) සුදුසුකම් සහිත හා කෙටි ලැයිස්තුගත අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණ සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය,**
**නො.73/5/A, "රුවන් සෙවණ", වැලිවිට, කඩුවෙල.**
**දුරකථන : 0112 -579187 / 0114-324679**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED